(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 1(1).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 ජනවාරි 25 අඟහරුවාදා**

---

**2022 පෙබරවාරි 08 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022.01.03 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද මුදල් අමාත්‍යවරයාගේ සහන පැකේජය පරිදි අස්වනු හානිය වෙනුවෙන් සහන ලබා දෙනු ලබන බෝග වර්ග කවරේද;

(ii) එම එක් එක් බෝග වර්ගය සඳහා හානිය තක්සේරු කිරීමේදී සළකා බලනු ලබන නිර්ණායක වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

30/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස් සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු සේවා කාලය;

(ii) එම උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු වෙනත් සුදුසුකම්;

(iii) පොලිස් විශේෂ කාර්ය බලකායේ සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු සේවා කාලය;

(iv) එම උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු වෙනත් සුදුසුකම්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උසස්වීම් ලබා දීමේදී, පොලිස් විශේෂ කාර්ය බලකායේ සැරයන්වරයකුට වඩා වැඩි සේවා කාලයක් අනෙකුත් පොලිස් සැරයන්වරයකුට සම්පූර්ණ කිරීමට සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) මේ හේතුවෙන් අනෙකුත් පොලිස් නිලධාරීන්ට අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(iii) ඉහත (i)හි සඳහන් සේවා කාලය සමාන කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

243/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාත සඳහා අනුමත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුරුවල මේ වනවිට සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) පළාතේ පුරප්පාඩු වී පවතින තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

564/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ගංගා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ගංගාවල භාරකාරත්වය නිශ්චිත ආයතනයකට පවරා නොමැති බව දන්නේද;

(iv) එම ගංගා ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1017/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම අධිවේගී මාර්ගය ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය මාර්ගයක් බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ පළමු අදියරේ සහ දෙවන අදියරේ වැඩ අවසන් කර තිබේද;

(ii) නොඑසේ නම්, එම එක් එක් අදියරේ වැඩ අවසන් කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම මාර්ගයේ තෙවන අදියරේ වැඩ ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iv) එම මාර්ගයේ තෙවන අදියරේ වැඩ කටයුතු සඳහා මුදල් වෙන් කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1173/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා "දරුවන් සුරකිමු ජාතික භාර අරමුදලේ" යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1186/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන බලපත්‍රලාභී මත්පැන් නිෂ්පාදනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එම නිෂ්පාදනාගාර පවත්වා ගෙන යනු ලබන ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් මත්පැන් නිෂ්පාදනාගාර අතරින් 2015 වර්ෂයෙන් පසුව වසා දමන ලද මත්පැන් නිෂ්පාදනාගාර තිබේද;

(ii) එසේ නම්, එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එම වසා දමන ලද නිෂ්පාදනාගාරවල නැවත මත්පැන් නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1306/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021.03.31 දින වනවිට ඉතාලියේ සේවය කරන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් 2019.03.31 දින සිට 2021.03.31 දින දක්වා වූ කාලය තුළ නැවත ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා අයදුම් කරන ලද සංඛ්‍යාව;

(iii) එම සංඛ්‍යාවෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණි සංඛ්‍යාව;

(iv) ඒ අතරින් රජයේ වියදමින් ශ්‍රී ලංකාවට ගෙන්වන ලද සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1465/2022

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දේශීය ලොකු ලූනු නිෂ්පාදනය කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ලොකු ලූනු නිෂ්පාදනය මිලදී ගැනීම සඳහා සකස් කර ඇති ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1725/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කඳුරුවෙල විකල්ප මාර්ගයේ කි.මී. 0 + 000 සිට කි.මී. 2 + 687 දක්වා වූ මාර්ග කොටස, මංතීරු 4ක මාර්ගයක් ලෙස පුළුල් කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට, රජයේ බීජ වී ගොවිපොළට අයත්වන සහ ප්‍රදේශවාසීන් විසින් භුක්ති විඳින ලද ගොඩ ඉඩම්, මඩ ඉඩම්, මුඩු ඉඩම්, ගෙවතු ඉඩම් සහ ස්ථිර ගොඩනැගිලි සහිත ඉඩම් රජයට පවරාගෙන තිබේද?

(ii) එසේ නම්, එසේ පවරාගෙන ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) පවරාගත් ඉඩම්වල හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ට වන්දි මුදලක් ගෙවා තිබේද;

(v) එසේ නම්, ගෙවනු ලැබූ වන්දි මුදල එක් එක් ඉඩම් හිමිකරු අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් මාර්ග කොටස පුළුල් කිරීම යටතේ මේ වනවිට වැඩ නිම කර ඇති දුර ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2022 පෙබරවාරි 08 අඟහරුවාදා)**

388/2022

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ළමුන්ට ශාරීරික දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් 2010 සිට 2021 දක්වා ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් පැමිණිලිවල ප්‍රතිඵලයක් ලෙස පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාව කොපමණද;

(iii) ශාරීරික දඬුවම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බව ප්‍රකාශ කරමින් 2020.12.17 වැනි දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් දැනට සිදු කෙරෙමින් පවතින නෛතික සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ කවරේද;

(ii) ශාරීරික දඬුවම් වැළැක්වීමට සහ අනුකූලතාව සහතික කිරීමට ස්ථාපිත කර ඇති යාන්ත්‍රණ කවරේද; සහ

(iii) ළමුන්ට ශාරීරික දඬුවම් කිරීමේ ගැටලු පොලීසියට සහ අධිකරණයට ගෙන යාමට බොහෝ දෙනෙකු අකමැති බැවින්, ඒවා පිළිබඳ දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ යාන්ත්‍රණයක් ආරම්භ කිරීමට රජයට හැකියාව තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 පෙබරවාරි 09 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති, යූරියා සහ නැනෝ තාක්ෂණය භාවිතා කර නිපදවන ලද "නැනෝ රජා" දියර පොහොර ප්‍රමාණය කොපමණද;

(ii) ආනයනය කිරීම සඳහා සැලසුම් කර ඇති මුළු "නැනෝ රජා" දියර පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) එම පොහොර ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 වර්ෂයේ මහ කන්නයේ භාවිතා කිරීම සඳහා ගොවීන් අතර බෙදා දී ඇති "නැනෝ රජා" දියර පොහොර ප්‍රමාණය සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද දියර පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉන්දියාවෙන් ආනයනය කරන ලද "නැනෝ රජා" දියර පොහොර භාවිතා කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති නිර්දේශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

31/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමට කිරි ආහාර වැදගත් බවත්;

(ii) ශ්‍රී ලංකාවට අවශ්‍ය දියර කිරි ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා මේ වනතෙක් ක්‍රියාත්මක කරන ලද සැලසුම් අසාර්ථක වී ඇති බවත්;

(iii) දියර කිරි සඳහා පවතින ඉල්ලුමට සරිලන පරිදි සැපයුම ප්‍රමාණවත් නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කිරි ගවයින් ආනයනය කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ආනයනය කරනු ලබන කිරි ගවයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ කිරි ගොවීන් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

244/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාවේ විෂය පථය හා කාර්ය පටිපාටිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කොමිෂන් සභාව මේ දක්වා එහි කාර්යභාරය සාර්ථකව ඉටුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් විගණන විමසුමක් ඉදිරිපත් කර ඇති බව දන්නේද;

(ii) එම විමසුමෙන් පෙන්වා දී ඇති ගිණුම්කරණ දෝෂ කවරේද;

(iii) එම ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

565/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාමීය ප්‍රාග්ධන බැංකුව නමින් බැංකුවක් ස්ථාපනය කර තිබේද;

(ii) එසේ නම්, එම බැංකුවේ ශාඛා සංඛ්‍යාව කොපමණද;

(iii) එම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ දක්වා ඉහත බැංකුවේ ශාඛාවලින් ණය ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම බැංකුව නිසි පරිදි නියාමනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1018/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත සඳහා වාරි ජලය ලබා දීමේ අරමුණින් වයඹ වාරි ව්‍යාපෘතිය ආරම්භ කර ඇති බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම මුදල සපයා ගනු ලබන මූලාශ්‍රය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය පොල්පිතිගම, සියඹලන්ගමුව වැවට ජලය ලබා ගැනීමට හැකි වන පරිදි සැලසුම් සකස් කර තිබේද;

(v) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1174/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1187/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ඉදිකරමින් පවතින කණු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ඇස්තමේන්තු මුදල කොපමණද;

(ii) එම මාර්ගයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) ඒ සඳහා අරමුදල් සපයා ගනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(iv) ඒ සඳහා අරමුදල් සපයන ලද ආයතන කවරේද;

(v) එම මාර්ගයේ ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1307/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 සහ 2020 වර්ෂවල ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම සඳහා වෙන් කරන ලද මුදල;

(ii) එම මුදලෙන් පාසල් ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම සඳහා වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශය මැදිහත්වීමක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මැදිහත්වන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 පෙබරවාරි 10 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිවේගී මාර්ග ව්‍යාපෘති සඳහා අත්කර ගන්නා ලද ඉඩම් කළමනාකරණය කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ඉඩම් කළමනාකරණය කිරීම සඳහා සමාගමක් ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතියක් ලබා දී තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට එම සමාගම ආරම්භ කර තිබේද;

(iv) නොඑසේ නම්, එම සමාගම ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(v) ඉහත සමාගමට ඉඩම් පවරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(vi) එම ඉඩම් පැවරීම සඳහා බලය ලැබී ඇති පනත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

32/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම පාඨමාලාව පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට එම පාඨමාලාව හදාරනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවාගැනීම මේ වන විට නවතා ඇති බවත්;

(ii) උපාධි පාඨමාලාවකට සමාන මෙම පාඨමාලාවට සිදු කරන ලද සංශෝධන මඟින් ඩිප්ලෝමා පාඨමාලාවක තත්ත්වය දක්වා පහත දමා ඇති බවත්;

(iii) එම පාඨමාලාව නවතා දැමීම සඳහා මේ වනවිට කටයුතු කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාවට උපාධි පාඨමාලාවක තත්වය නැවත ලබා දීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඉහත උපාධිධාරීන්ට අනෙකුත් ආයුර්වේද වෛද්‍යවරුන්ට හිමි වරප්‍රසාද ලබාදීමට රජය කටයුතු කරන්නේද;

(iii) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවාගැනීම නැවත ආරම්භ කරන්නේද;

(iv) එම පාඨමාලාව නතර කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

245/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව සඳහා බත්තරමුල්ල ප්‍රදේශයෙන් ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ගොඩනැගිල්ලේ නම සහ එම ගොඩනැගිල්ල අයිතිකරුගේ නම කවරේද;

(iii) එම ගොඩනැගිල්ල සඳහා ගෙවනු ලබන මාසික සහ වාර්ෂික කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අධික මුදලක් වැය කර කොමිෂන් සභාව සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

566/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉස්ලාම් පාසල් පෙළ පොත්වලට ආගමික අන්තවාදය අන්තර්ගත පාඩම් ඇතුළත් කර ඇති බව පාස්කු ඉරුදින ත්‍රස්තවාදී ප්‍රහාරය විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවෙන් අනාවරණය වූ බව දන්නේද;

(ii) එම පාඩම් ඉස්ලාම් පාසල් පෙළ පොත්වලට ඇතුළත් කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලද නිලධාරින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම නිලධාරින්ට එරෙහිව මේ වනතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ආගමික අන්තවාදය අන්තර්ගත පාඩම් පාසල් පෙළ පොත්වලින් ඉවත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1019/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පිහිටුවා ඇති බන්ධනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) එම බන්ධනාගාරවල රඳවා තැබිය හැකි රැඳවියන් සංඛ්‍යාව හා මේ වනවිට රඳවා තබා ඇති රැඳවියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ධාරිතාවය ඉක්මවා රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(v) රඳවා තබා ඇති අතිරික්ත රැඳවියන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1175/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1188/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය මිලදී ගනු ලබන කුඩා ජල විදුලි බලාගාර සංඛ්‍යාව;

(ii) ඒවායේ ධාරිතාවය;

(iii) කුඩා ජල විදුලි බලාගාරවලින් උත්පාදනය කරනු ලබන විදුලිය ඒකකයක් ලබා ගනු ලබන මිල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කුඩා ජල විදුලි බලාගාර ඉදිකිරීම සඳහා අනුමතිය ලබා දීම මේ වනවිට නතරකර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1308/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආයුර්වේද ඖෂධ පර්යේෂණ ආයතනයක් ස්ථාපිත කර තිබේද;

(ii) වර්ෂ 2016 සිට 2020 දක්වා එම ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පර්යේෂණ තුළින් හඳුන්වා දෙන ලද නව නිෂ්පාදන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1466/2022

ගරු රෝහණ බංඩාර මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා තලාව ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර ඇති කඩ කාමර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ දක්වා බෙදා දී නොමැති කඩ කාමර සංඛ්‍යාව කොපමණද;

(iii) බෙදා දී නොමැති කඩ කාමර කඩිනමින් බෙදා දීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1726/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් ඩිපෝවේ ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් එක් එක් ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මානවලට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ මඟින් ප්‍රවාහන පහසුකම් ලබා දීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 පෙබරවාරි 11 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 1/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයන් සමාජය තුළ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රිය පුද්ගලයන් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.3/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.4/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.5/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දේශීය කෘෂි නිෂ්පාදනයේ ඉහළ ඵලදායකත්වය සඳහා වන සතුන්ගෙන් සිදුවන වගා හානි වළක්වා ගැනීම හා වගා හානිපූරණය කිරීම,— සුළු පරිමාණ හා ගෙවතු වගා ලෙස කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවි ජනතාව වගා කරන සාදික්කා, කරාබු, ගම්මිරිස්, පොල්, විවිධ පලතුරු ආදී ස්ථිර බෝග මෙන්ම, අල, ලූනු, එළවළු, වී ආදි කන්න බෝග වගාවන්ට රිලව්, වල් ඌරන්, ඉත්තෑවන්, අලි ආදී විවිධ වන සතුන්ගෙන් සිදුවන හානි වැළැක්වීම සඳහා අදාළ සියලුම අමාත්‍යාංශ ඒකාබද්ධව ජාතික කෘෂි නිෂ්පාදන ආරක්ෂිත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීමට ද, වන සතුන්ගෙන් සිදුවන වගා හානි සඳහා පූර්ණ වන්දි ලබාදෙන වගා රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට ද, රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.6/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දහම් පාසල් අධ්‍යාපනය දියුණු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් සම්පාදනය කිරීම,— දහම් පාසල් අධ්‍යාපනය තුළින් ගුණ දහමෙන් ශික්ෂිත සමාජයක් ගොඩ නැංවීමට පදනම සැකසෙන නමුදු, එම පාසල්වල පවතින භෞතික සම්පත් හිඟය මත ඇතිවෙන දුෂ්කරතා නිසා බොහෝ දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු නොවන හෙයින් රටේ බහුතරයක් දහම් පාසල්වලට අත්‍යවශ්‍ය ඉගෙනුම් මේස, බංකු, ගුරු මේස, ගුරු පුටු, කළු ලෑලි, සුදු ලෑලි මෙන්ම, එහි කුඩා දහම් පුස්තකාල සඳහා පොත් අල්මාරි සපයා දීමටත්, දහම් පාසල් දරුවන් සඳහා ළමා සාරිය, ජාතික ඇඳුම වැනි ඇඳුමක් වෙනුවෙන් අවශ්‍ය රෙදි ලබාදීමටත්, පුද්ගලික අංශයේ හා දානපතීන්ගේ දායකත්වය ද සහිතව රජය විසින් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.7/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුවක් හා ආර්ථික නායකත්වයක් ගොඩනැඟීම,— ශ්‍රී ලංකාව තුළ අධික පොළියට ක්‍රියාත්මකවන ක්ෂුද්‍රමූල්‍ය ණය, මූල්‍ය සමාගම් ණය, හා කල්බදු ණය උගුලෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගලවා ගනිමින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් නවෝත්පාදන නිෂ්පාදන හා අගය එකතු කරන ව්‍යාපාරවල නියැලෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට, කෘෂි නිෂ්පාදකයන්ට හා සේවා සපයන ව්‍යවසායකයන්ට, ලිහිල් කොන්දේසි හා ලිහිල් පොළියකට දිගුකාලීනව ගෙවිය හැකිවන පරිදි මූල්‍ය ණය ලබාදෙන බැංකුවක් ස්ථාපනය කිරීමටත්, රටේ ආර්ථික වර්ධනයට, රැකීරක්ෂා ජනිත කිරීමට හා රටේ සම්පත්වලින් ඉහලම ඵලදායිකත්වයක් ලබාගැනීමට සහය වන ව්‍යවසායක ආර්ථික නායකත්වයක් ගොඩනැඟීමටත්, දැනට ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහාය ලබාදෙන සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර දේශීය ව්‍යවසායකත්ව සංවර්ධන හා ආර්ථික පුනර්ජීවන කාර්යසාධන බලකායක් ඇති කිරීම උදෙසා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.8/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් ප්‍රමිතිකරණය කිරීම,— රටක අනාගතයේ සබුද්ධික පුරවැසියකු බිහිවීමට මුල් ළමාවිය සංවර්ධනය පදනම් වන හෙයින් දිවයිනේ පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා මුල් ළමාවිය මධ්‍යස්ථාන ඉහළ ප්‍රමිතියකින් පැවැත්විය යුතු බැවින් ද, එකී මධ්‍යස්ථාන ලියාපදිංචි කර, නිසි ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම නියාමනය කිරීමටත්, ඒවා පවත්වාගෙන යන ව්‍යවසායකයන්ට හා කාර්ය මණ්ඩලවලට ජාතික වෘත්තීය නිපුණතා (NVQ) සහතිකපත් තිබීම අනිවාර්ය කිරීමටත්, එවන් මධ්‍යස්ථානවල පැවතිය යුතු ඉඩකඩ හා යටිතල පහසුකම් පිළිබඳ නිර්දේශ නීතිගත කිරීමටත්, එහි සේවය කරන්නන්ට දායකත්ව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමටත්, දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම එවන් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සහන පොළියට ණය පහසුකම් ලබාදීමටත්, අවශ්‍ය ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට ජාතික මුල් ළමාවිය සංවර්ධන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට රජය විසින් යෝග්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.9/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— විසිඑක් වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි සමූපකාර ව්‍යාපාරයක් බිහිකිරීම,— ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින සමූපකාර ක්‍රමය දැනට අඩ සියවසකට පෙර පත්කරන ලද සමූපකාර ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ අනුව ස්ථාපිත කරන ලද්දක් වන හෙයින් ද, මෙම ව්‍යාපාරය විසිඑක් වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි එනම්, ආත්මාධාරය, අන්‍යෝන්‍යාධාරය හා සකසුරුවම යන සමූපකාර මූලධර්ම මත පදනම්ව වත්මන් සියවසේ අභියෝග ජය ගැනීමට සමත්, නව තාක්ෂණය භාවිතයෙන් මහා පරිමාණ වෙළෙඳ ජාල සමඟ සාර්ථකව තරඟ කළ හැකි ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයටත්, ප්‍රාග්ධන ගැටලුව සහ වෙළෙඳපොළ ගැටලුවලට සාර්ථක විකල්පයක් ලෙසත්, අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයටත් යොදාගත හැකි සුවිශාල වත්කම් ප්‍රමාණයක් හිමි ක්ෂේත්‍රයක් වන හෙයින් ද, වත්මන් සමූපකාර ක්‍රමය ඉහත කී අභිප්‍රායන් සංවර්ධනය කිරීම සඳහා අදාළ නව ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට, සමූපකාර ව්‍යාපාරයේ සැබෑ හිමිකරුවන් වන සමූපකාර කොටස් හිමිකරුවන්ගේ බලය වැඩිකර සමූපකාර ව්‍යාපාරය පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක්කිරීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.10/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— කාන්තා අයිතීන් සුරැකීම හා කාන්තා අභිවෘද්ධිය සැලසීම,— කාන්තාවන්ගේ කායික, මානසික, සාමාජීය සුරක්ෂිතභාවය හා අභිවෘද්ධිය සැලසීම රටේ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතාවයක් වන හෙයින්, කාන්තාවන්ට නිසිලෙස නොසැළකීමට එරෙහිව නඩු විභාගයකින් දඬුවම් පැමිණවීමටත්, කාන්තා හිංසනය, අපයෝජනය, බාලවයස්කාර දැරියන් හෝ කාන්තාවන් දූෂණය කිරීම සම්බන්ධයෙන් ඇප ලබා නොදෙන නීති පැනවීමටත්, පොලීසියේ කාන්තා හා ළමා අංශයේ බලතල පුළුල් කිරීමටත්, නඩත්තු හා දික්කසාද නඩු අප්‍රමාදව විසඳීමට යෝග්‍ය අධිකරණ ක්‍රියාවලියක් ඇති කිරීමටත්, බස් රථවල කාන්තාවන් සඳහා එක් පසක අසුන් පෙළක් වෙන් කිරීමටත්, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල සූරාකෑමට හසුවන්නන්ගේ ණය කපා හැරීමට නීති පැනවීමටත්, සෑම නිවසකටම ජලය සහ ඉවුම් පිහුම් සඳහා අඩුවියදම් බලශක්තිය සහතික කිරීමටත්, මුළුතැන්ගෙයි උපකරණ සහන පොළියට ගැනීමට බැංකු පහසුකම් ලබාදීමටත්, වැන්දඹු කාන්තාවන්ට තම ස්වාමිපුරුෂයා ලබමින් සිටි වැටුප ගෙවීම නීතිගත කිරීමටත්, විරැකියා වැන්දඹුවන්ට රජයෙන් යැපුම් දීමනාවක් ලබාදීමටත්, සමාන සේවයට සමාන වැටුප් ලබාදීම නීතිගත කිරීමට හා කාන්තා නිෂ්පාදන අළෙවියට සුදුසු අලෙවි ජාලයක් ගොඩනැඟීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සහ නීති අණපනත් සෑදීම සඳහා රජය විසින් කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.11/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ඉහළ නැංවීම,— මැණික් ඉඩම් හඳුනාගැනීමේ සිට මැණික් වෙළෙඳපොළ අලෙවිය දක්වා කටයුතුවලට විවිධ පාර්ශ්ව සම්බන්ධවීම හා නොයෙකුත් ව්‍යුහයන් ක්‍රියාත්මකවීම සිදුවුවත්, ඒවා අතර අන්තර් සබඳතාවයක් නොමැතිවීම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රගතියට හා සංවර්ධනයට මහත් බාධාවක් වන හෙයින්, මෙම කර්මාන්තයට අදාළ ජාතික ප්‍රමුඛතා ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර, කර්මාන්තයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට අදාළ අන්තර් සබඳතාවය ගොඩනැංවීමටත්, අගය එකතුකරන ලද මැණික් හෝ මැණික් යොදාගත් නිෂ්පාදන දිරිගැන්වීමට බදු සහන ඇතුලු සානුබල ලබාදීමටත්, මැණික් කර්මාන්තයේ නියැලෙන පතල්කරුවන්ගේ ජීවිත අවදානමට මෙන්ම, පතල් මඟින් පරිසරයට සිදුවන හානි පූර්ණය කිරීම සඳහා රක්ෂණ ආවරණයක් ඇතිකිරීමටත්, කැණීම් බලපත්‍රයක් ලබාගැනීම පූර්ණ කොන්දේසියක් ලෙස නීතිගත කිරීමටත්, මැණික් ලාභීන්ට ලැබෙන මුදල් ප්‍රති ආයෝජනය කිරීමට අවස්ථා පුළුල් කිරීමටත්, මැණික් මිලදීගැනීමට පැමිණෙන විදේශිකයන්ට පණවන සීමා ඉවත් කිරීමටත්, මැණික් භාවිතා කර අත්කම් නිෂ්පාදන ඇතුළු ගෘහ කර්මාන්තය දක්වා නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමටත්, අලෙවිකරණය දක්වා සියලු ක්ෂේත්‍රවලදී නව තාක්ෂණය යොදාගැනීමටත් යෝග්‍ය ප්‍රතිපත්ති සහ අණපනත් සෑදීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.12/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු අපනයන බෝග ආර්ථික මධ්‍යස්ථානයක් ඇතුළත් අපනයන කෘෂි බෝග ආශ්‍රිත නවෝත්පාදන කර්මාන්ත කලාපයක් බිහිකිරීම,— අතීතයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සුළු අපනයන බෝගවලට උරුමව පැවති "සිලෝන් ස්පයිස්" යන කීර්ති නාමය යළි ගොඩනඟා ගනිමින් ගෝලීය වෙළෙඳපොළ ජය ගැනීමට සුළු අපනයන බෝග බහුලව නිෂ්පාදනය කරන දිස්ත්‍රික්ක පදනම් කරගත් ආර්ථික මධ්‍යස්ථාන ඇතුළත් එම බෝග ආශ්‍රිත අගය එකතු කරන ලද නවෝත්පාදන කර්මාන්ත කලාප බිහි කරන ලෙසත්, මෙම අපනයන නිෂ්පාදන සඳහා දැනට ක්‍රියාත්මක බදු ප්‍රතිපත්තිය සමාලෝචනය කර අපනයන කෘෂි බෝග කර්මාන්තයේ ප්‍රගමනයට අදාළ බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කරන ලෙසත්, සුළු අපනයන බෝග වගාකරුවන් දිරිගැන්වීමට සහනයක් ලෙස අස්වනු අළෙවියෙන් පසු ගෙවීමේ ක්‍රමයට ණය පහසුකම්

ලබාදීම සහ ඒ සමගම වගා රක්ෂණයක් ගොවිමහතුන්ට ලබාදීමේ ක්‍රමෝපායක් ඇතිකිරීමටත් රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— උඩරට නැටුම්, සම්ප්‍රදායික කලා ශිල්ප, ලී කැටයම්, මූර්ති හා ගෘහ නිර්මාණ ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත් කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම,— ශ්‍රී ලංකාවේ ඓතිහාසික ප්‍රෞඪත්වය සහ අනන්‍යතාවය විදහාපාන සාම්ප්‍රදායික උඩරට නැටුම් හා කලා ශිල්ප, චිත්‍ර, ලී කැටයම්, මූර්ති සහ ගෘහ නිර්මාණ ශිල්පය අප රටට පමණක් උරුම ඒක දේශීය විරල සංස්කෘතික හා කලා ශිල්ප වන හෙයින්, ඒවා ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, එකී උරුමයන් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමටත්, එම කලා ශිල්ප ආරක්ෂා කරමින් පවත්වාගෙන යන ශිල්පීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය ඇතිකිරීමටත්, උඩරට උරුමයන් ආරක්ෂා කොට, ප්‍රවර්ධනය කර, විධිමත් ලෙස පාලනය කිරීමට ව්‍යවස්ථාපිත පදනමක් හෝ මණ්ඩලයක් ස්ථාපිත කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.14/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ශ්‍රී ලංකාවේ විදේශ සේවා කටයුතු ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමෙන් 8%ක් පමණ දායකත්වයක් විදේශගත ශ්‍රම බලකායෙන් ලැබෙන හෙයින්, එම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට විදේශීය ශ්‍රම ඉල්ලුමට සමගාමීව ශ්‍රමිකයන් පුහුණු කරන ආයතනයක් ස්ථාපිත කිරීමටත්, විදේශගත පුරවැසියන්ට ඡන්ද බලය භාවිත කිරීමට අවස්ථාව සලසාදීමටත්, ඔවුන්ට දායක විශ්‍රාම වැටුපක් වැනි සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීමටත්, විදේශ සේවය හේතු කොට ගෙන ඇතිවන නොවැළැක්විය හැකි දුර්භාග්‍ය අවස්ථාවල දී මෙන්ම අනතුරු විපත්වල දී වන්දි ලබාදෙන රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ඔවුන්ගේ ඉතුරුම්වලට වැඩි පොලියක් බැංකු මඟින් ලබාදීමටත්, නිවාස ඉදිකර ගැනීමට සහන පොලී සහ ණය ලබාදීමටත්, රජයේ රැකියා ලබාදීමේ දී විදේශගත දෙමාපියන්ගේ දරුවන්ට ප්‍රමුඛත්වයක් ලබාදීමටත්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් සහ මෙරට හා විදේශීය රැකියා ඒජන්සිවලින් සිදුවන අකටයුතුකම් කඩිනමින් විසඳීමට යෝග්‍ය ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ශ්‍රමිකයන් ලියාපදිංචියේ දී අයකරන ගාස්තු වලින් හා ගෘහ සේවයට පිටත්වීමේ දී ඒජන්සි ලබාදෙන මුදලින් කොටසක් ලබාගෙන පෙර විගමනික හා පසු විගමනික භාරයක් ඇති කිරීම සඳහාත් රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.15/2022

ගරු රෝහණ බංඩාර මහතා,— දේශීය බීජ නිෂ්පාදන ක්‍රියාවලිය පණගැන්වීම,— වර්තමානය වනවිට දේශීය බීජ නිෂ්පාදනය විදේශීය සමාගම්වල ග්‍රහණයට හසු වී තිබෙන හෙයින් ද, එමඟින් දේශීය කෘෂි කර්මාන්තයට අහිතකර ප්‍රතිඵල අත් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.16/2022

ගරු රෝහණ බංඩාර මහතා,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ලබාදීම,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඔවුන් ඉතා අසරණ තත්ත්වයකට පත්වී සිටින හෙයින්, මෙම සේවයේ නියුතු නිලධාරීන් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.17/2022

ගරු රෝහණ බංඩාර මහතා,— ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කාලීන අවශ්‍යතා අනුව වෙනස් කිරීම,— සංවර්ධිත රටවල පවා ගොවි ජනතාව වෙනුවෙන් විවිධ සුබසාධන වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වන ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කාලීන අවශ්‍යතා අනුව වෙනස් නොවීම හේතුවෙන් ඒ සඳහා ගොවීන් ආකර්ෂණය කර ගැනීමේ දුෂ්කරතා මතු වී ඇති හෙයින් ද, ගොවි ජනතාවට වැඩි ප්‍රතිලාභ ලැබෙන ආකාරයට මෙම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් නැවත සමාලෝචනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.18/2022

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපනය සඳහාම වෙන් වූ රූපවාහිනී නාලිකාවක් ආරම්භ කිරීම,— පවත්නා කොවිඩ්-19 වසංගතය හමුවේ වර්තමානය වනවිට පාසල් වසා දමා තිබීම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට ප්‍රයෝජනවත් වන අධ්‍යාපනය සඳහාම වෙන් වූ රූපවාහිනී නාලිකාවක් රජය විසින් කඩිනමින් ආරම්භ කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.19/2022

ගරු රෝහණ බංඩාර මහතා,— පළාත් පාලන ආයතනවල රැකියා ලබා දීමේ දී සාධාරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම,— මහජනතාව වෙනුවෙන් උපතේ සිට මරණය දක්වාම වැදගත් කාර්ය භාරයක් ඉටු කරන පළාත් පාලන ආයතනවල සුළු සේවක, කම්කරු ආදී පත්වීම් ලබාදීමේ දී බොහෝ විට එම පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ කොට්ඨාසයට සුවිශේෂීතාවයක් ලබාදෙන අවස්ථා වර්තමානයේ දක්නට ලැබෙන හෙයින් එම තත්ත්වය වෙනස්කොට අදාළ පළාත් පාලන ආයතනයේ සෑම කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි එම රැකියා බෙදා හැරීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.20/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— දරුවන්ට එරෙහිව සිදුවන ශාරීරික දඬුවම් ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම,— දරුවන්ට එරෙහිව සිදුවන ශාරීරික දඬුවම් හා මානසික හිංසන හෙළාදකිමින් 2021.02.12 දින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/97/2017 මඟින් දණ්ඩ නීති සංග්‍රහයේ අංක 341(i) වගන්තිය අහෝසි කිරීම, UNCRC හි වගන්ති අංක 19, 28(2) සහ 37 ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 12/2016 ක්‍රියාත්මක කිරීම සඳහා තීන්දුවක් ලබා දී ඇති හෙයින් ද, 2020.03.01 දින අවුරුදු 08 ක දැරියක් නිවසේදී වේවැලකින් පහර දී මරණයට පත්කිරීමේ සිදුවීම පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය අවධානයට ලක් වුවද ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මත හෝ ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු පියවර ගනු නොලැබූ හෙයින් ද, දරුවන්ට ඇතිවිය හැකි දීර්ඝකාලීන අහිතකර ප්‍රතිවිපාක ඉස්මතු කරමින් 2018.02.02 එක්සත් ජාතීන්ගේ ළමා අයිතීන් පිළිබඳ කමිටුවේ (UNCRC) ශ්‍රී ලංකාව පිළිබඳ අධීක්ෂණ වාර්තාව මඟින් ළමා ආරක්ෂණයේ අර්බුදකාරී තත්ත්වය, විශේෂයෙන්ම ශාරීරික දඬුවම් අවසන් කිරීම අවධාරණයට ලක් කර ඇති හෙයින් ද, 2020.10.06 දිනැති පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා අංක 304/2020 හි සඳහන් වන පරිදි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් විශාල වශයෙන් ඉහළ යන ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ සේවාව පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව ප්‍රකාශ කර ඇති හෙයින් ද, කඩිනමින් නීති වෙනස් කිරීමෙන් සහ පවතින නීති විධිමත්ව ක්‍රියාත්මක කිරීමෙන් ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික අර්බුදය අවසන් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ශ්‍රී ලංකාවේ මනෝ උපදේශකවරුන්/ මනෝ චිකිත්සකවරුන් නියාමනය කිරීම,— වෘත්තීමය නොවන සහ කිසිදු සායනික පුහුණුවක් නොමැති ව්‍යාජ මනෝ උපදේශකවරුන් සහ මනෝ චිකිත්සකවරුන් ශ්‍රී ලංකාව පුරා ව්‍යාපාර සිදුකරගෙන යෑම නිරීක්ෂණය වී ඇති හෙයින් ද, විවිධ අධ්‍යාපන ආයතනවලින් ඩිප්ලෝමා සහතිකයක් පමණක් ලබාගෙන කිසිදු සායනික පුහුණුවක් හෝ වෘත්තීය ආචාරධර්මයකට අනුගත නොවී විවිධ ආයතන පිහිටුවා ගනිමින් සමාජ මාධ්‍ය ඔස්සේ තමන් මනෝ උපදේශකවරයෙකු/ මනෝ චිකිත්සකවරයෙකු ලෙස හුවා දක්වමින් තම සායනවලට ජනතාව ගෙන්වාගැනීමේ තත්ත්වයක් වර්ධනය වී ඇති හෙයින් ද, මනෝ චිකිත්සකවරු සහ මනෝ උපදේශකවරු මෙන්ම මනෝ උපදේශනය සහ චිකිත්සනය පිළිබඳ ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා නිසි නියාමනයකට ලක්කිරීම, මනෝ-සමාජීය සේවාවන්ට ප්‍රවේශවීමේ දී නිසි ක්‍රියා පිළිවෙතක් සැකසීම, ලිංගික විවිධත්වය තුළ යල් පැනගිය ප්‍රතිකර්ම වන පරිවර්තන චිකිත්සා තහනම් කිරීම යනාදිය පිළිබඳ විශේෂ සැලකිල්ලක් යොමුකර ශ්‍රී ලංකාවාසී පුරවැසියන්ට නිසි මනෝ-සමාජීය සෞඛ්‍ය සේවා ප්‍රවේශයකට මග සලසාදීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.